


# 23

# යහළුවෝ

ආචාර්ය ඊ. ඩබ්ලිව්. අදිකාරම් යනු ලංකාවේ බෞද්ධ පාසල් රැසක් ආරම්භ කිරීමට පුරෝගාමී වූ විද්වතෙකි. පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය නමැති නිබන්ධය සඳහා ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් ආචාර්ය උපාධිය ලැබූ අදිකාරම්, සිංහල විද්‍යා අධ්‍යාපන ක්ෂේත්‍රයට ද දායකත්වය සැපයී ය. ඔහු විද්‍යාව සිංහල මාධ්‍යයෙන් ඉගැන්වීම සඳහා පාරිභාෂික ශබ්ද මාලාවක් සම්පාදනයට කටයුතු කළේ ආර්ථික දුෂ්කරතා හේතුවෙන් විද්‍යා අධ්‍යාපනයේ ඉහළට ම යෑමට තමාට අහිමි වූ අවස්ථාව බොහෝ දරුවන්ට උදා කර දෙමිනි. විද්‍යා පොත් හා විද්‍යා සඟරා ප්‍රකාශයට පත් කිරීමෙන් ද පුවත්පත් ලිපි ලිවීමෙන් ද ගුවන්විදුලි කතා පැවැත්වීමෙන් ද ඔහු සිංහල මාධ්‍ය විද්‍යා අධ්‍යාපනයට අනුබල දුන්නේ ය. ඔහු විසින් සම්පාදනය කරන ලද පාඨශාලීය සිංහල ශබ්දකෝෂය බෙහෙවින් ප්‍රයෝජනවත් කෘතියකි. ඔහු පාසල් පරිපාලනයේ දී හා ශිෂ්‍ය විනය සංවර්ධනයේ දී අහිංසාවාදී සිතුවිලි පදනම් කර ගත්තේ ය. සාමකාමී ලොවක් ගොඩනැගීම සඳහා ආචාර්ය අදිකාරම් විසින් කරන ලද සේවය ඇගයීමට එක්සත් ජාතීන්ගේ සංගමයේ ශ්‍රී ලංකා ශාඛාවෙන් 1988 දී එතුමාට සාම ත්‍යාගය පිරිනමන ලදි. සමාජයේ චින්තනය දියුණු කිරීමේ පරමාර්ථයෙන් ආචාර්ය අදිකාරම් විසින් පළ කරන ලද සිතුවිලි සඟරා කාණ්ඩ 58කි. එහි 41 වන කාණ්ඩයෙන් උපුටා ගත් කතාවක් මේ පාඩමට ඇතුළත් වේ.

ප්‍රිය ශිෂ්‍ය ශිෂ්‍යාවනි,

ඔබ සැම දෙනාට ම කුඩා යහළුවන් ඇතැයි සිතමි. එයින් සමහර දෙනෙක් අසල් වැසියන් වන්ට පුළුවන, සමහරෙක් ඉස්කෝලයේ හෝ ඔබේ පඞ්ක්තියේ ම හෝ සිටින ළමයින් වන්ට පුළුවන.

කුඩා කාලයේ සමාන වයසක ළමයින් සමග මිත්‍ර වීම ළමා වයසෙහි දී ස්වාභාවික වශයෙන් සිදු වන දෙයකි. එය මනුෂ්‍යයාට අවශ්‍ය දෙයක් යයි ද සිතා ගැනීමට ඉඩ තිබේ.

මේ සම්බන්ධයෙන් කුඩා ළමුන් පර්යේෂණයකට භාජන කර නොමැති යි. එහෙත් ඒ වෙනුවට කුඩා වඳුරු පැටවුන් අරගෙන පර්යේෂණ පවත්වා තිබේ.

කුඩා කාලයේ දී සම වයස්ක වෙනත් වඳුරු පැටවුන් සමග සෙල්ලම් කිරීමට ඉඩ නො ලැබුණු වඳුරු පැටවු ලොකු වන විට වඳුරු සිරිත් විරිත් නො දන්නා, වඳුරු සමාජයට නො ගැළපෙන වඳුරෝ වූහ. වඳුරා මනුෂ්‍යයාට බොහෝ සෙයින් කිට්ටු සම්බන්ධකම් ඇති සත්ත්වයෙකි. එහෙයින් ඒ වඳුරු පැටවුන්ට සිදු වන දේ මනුෂ්‍යයාටත් සිදු වෙති'යි නිගමනය කිරීමට ඉඩ තිබේ...

...කුඩා කාලයේ දී ඇති වන මිත්‍රත්වය බොහෝ විට සෙල්ලම් කිරීම ආදියට සීමා වෙයි. වයසින් වැඩෙත් ම ඒ මිත්‍රයන් කෙනෙකුට නැති වී යන්ට පුළුවන. එහෙත් මිත්‍රත්වය හෙවත් යහළු බව කුඩා දරුවාගේ ජීවිතයේ වැදගත් කොටසක් වී වැඩෙන්ට පුළුවන.

සැබෑ මිත්‍රත්වය ආත්මාර්ථයෙන් හෙවත් තමා ගැන ම සිතීමෙන් තොර වූවකි. මෛත්‍රිය යයි ද මීට ම නමකි. "මෛත්‍රී" යන වචනය සෑදී තිබෙන්නේ ද "මිත්‍ර" යන්නෙන් ය. කල්‍යාණ මිත්‍රයාගේ ස්වභාවය හෙවත් හොඳ මිතුරකුගේ ගතිය මෛත්‍රිය යි.

අභාග්‍යයකට මෙන් හොඳ මිත්‍රත්වය අතිශයින් ම දුර්ලභ වූ ගතියකි. එය ප්‍රේමය නො වේ, ස්නේහය නො වේ. ආදරය යන වචනයේ පොදු තේරුම ද එහි නැත. ප්‍රේමයත් ස්නේහයත්, පොදු ව්‍යවහාරයෙහි පාවිච්චි වන ආදරයත්, ආත්මාර්ථකාමී ගති ය, තමා ම මුල් කර ගෙන ඇති වන හැඟීම් ය. කල්‍යාණ මිත්‍රතාව හෙවත් මෛත්‍රිය එවැන්නක් නො වේ. එහි තමා ය අනුන් ය යන භේදයක් නැත. කුඩා ම කාලයේ දී අම්මා කෙරෙහි ද ඊට පසු සෙල්ලම් කරන ළමයින් කෙරෙහි ද හට ගන්නා යාළුකම නො කෙලෙසී විකාශනය වන්ට ඉඩ හැරිය හොත් නියම මිත්‍රත්වය කවදා හෝ කෙනෙකු තුළ විකාශනය

වන්ට බැරි නැතැයි සිතීමට පුළුවන. දෙමවුපියන් විසින් ද ගුරුවරුන් විසින් ද ළමයෙකුට කළ හැකි ලොකු ම සේවය කුඩා කාලයේ දී ළමයෙකු තුළ හට ගන්නා ඒ මල් පොහොට්ටුව විනාශ වන්ට නො දී ආරක්ෂා කර දීම ය. ඒ මල් පොහොට්ටුවේ පිපීම සිදු කර දීමට මවුපියන්ට වත් ගුරුවරුන්ට වත් වෙන කිසිවෙකුට වත් නුපුළුවන. කළ හැකිව තිබෙන්නේ නොයෙකුත් උපද්‍රවයන් නිසා ඒ කැකුළ වියළී යන්ට වත් කැඩී බිඳී යන්ට වත් ඉඩ නො ලැබෙන සේ ආරක්ෂා කර දීම පමණ ය. පිපීම පුද්ගලයා තුළින් ම සිදු විය යුත්තකි.

මෙම සාකච්ඡාව අවසන් කිරීමට කලින් අපේ පැරණි පොතක දැක්වෙන එක්තරා පුවතක් ගැන සඳහන් කිරීම සුදුසු යයි සිතමි.

බුදුන්වන්සේ ද උන් වහන්සේගේ ඥාති සහෝදරයකු වූ ආනන්ද හාමුදුරුවන් වහන්සේ ද එක් දිනයක සවස් භාගයෙහි කථා සල්ලාපයක යෙදී සිටියහ. "ස්වාමීනි, උසස් ම ජීවිතයෙන් දෙකෙන් පංගුවක් කල්‍යාණ මිත්‍රයෙකු වීම යයි සිතමි"යි ආනන්ද හාමුදුරුවන් වහන්සේ කීවේ ලු. එවිට බුදුන්වහන්සේ මෙසේ කීවේ ය. "එසේ නො කියව ආනන්ද, එසේ නො කියව ආනන්ද, උසස් ම ජීවිතයෙන් දෙකෙන් පංගුවක් නො ව සම්පූර්ණයෙන් ම බ්‍රහ්ම චරියාව කල්‍යාණ මිත්‍රතාව වන්නේ ය."

බ්‍රහ්ම යන්නෙහි තේරුම ඉතා ම උසස් යන්න ය. චරියා යනු හැසිරීම ය. එහෙයින් බ්‍රහ්ම චරියා යනු ඉතාම උසස් හැසිරීම ය. බ්‍රහ්ම විහාර යනු ද මීට ම සමානාර්ථ වේ. විහාර යනු වාසය කිරීම ය, ජීවත් වීම ය. මෛත්‍රිය හෙවත් මිත්‍රතාව ද බොහෝ විට බ්‍රහ්ම විහාර යන නමින් ම හැඳින් වේ.

යහළුකම ඉතා උතුම් දෙයකි. එය ආත්මාර්ථයෙන් කිළිටි කළ යුතු නො වේ.

**සිතුවිලි - 4වන කාණ්ඩය**

ඉහත ඔබ කියවූ ලිපියේ මිත්‍රත්වය පිළිබඳ අපූරු විග්‍රහයක් දැක්වෙයි. ඒ, ඊ. ඩබ්ලිව්. අදිකාරම් කුඩා ළමයින්ට මිත්‍රත්වය පිළිබඳ සිය අදහස් ප්‍රකාශ කළ ආකාරය යි. කිසියම් කරුණක් පිළිබඳව ඉදිරිපත් කරනු ලබන සමස්ත පැහැදිලි අදහසක් දර්ශනයක් ලෙස හැඳින්විය හැකි ය. අදිකාරම් වැඩි වශයෙන් අවධානය යොමු කළේ ළමයින් හා තරුණ පරපුර යහමග යැවීමට ය. චින්තකයකු වශයෙන් ශ්‍රී ලංකා ජනතාවගේ චින්තනයෙහි වෙනසක් ඇති කිරීමේ අරමුණින් ඔහු නවීන විද්‍යා සඟරාව හා සිතුවිලි නම් පුස්තිකා මාලාව සම්පාදනය කළේ ය. පාරම්පරික විශ්වාස හා ඇදහිලිවලින් ඈත් වූ, ආචාර්ය අදිකාරම් පළ කළ ඇතැම් අදහස් තියුණු මත භේදයට හා විවේචනයට ද ලක්

විය. එතුමාට ජාති භේදයක්, ආගම් භේදයක් හෝ පන්ති භේදයක් නො වීය. මුළු මිනිස් වර්ගයා ම එක ම ජාතියක් ලෙස සැලකූ ඔහු වර්ගවාදී ගැටුම්වලින් තොර සාමකාමී ලොවක් ගොඩනැඟීම සඳහා නිරතුරුව කැප වී කටයුතු කළේ ය. එම උදාර කැප වීම වෙනුවෙන් එතුමාට කරන ලද උපහාරයක් ලෙස 1980 දී එක්සත් ජාතීන්ගේ සංගමයේ ශ්‍රී ලංකා ශාඛාව විසින් පළමු වරට සාම ත්‍යාගය පිරිනමන ලදි. එයින් ලැබුණු රුපියල් දස දහසක් වටිනා චෙක්පත සාම කටයුතු සඳහා යොදා ගැනීමට ශ්‍රී ලංකා ක්‍රිෂ්ණමූර්ති මධ්‍යස්ථානයට පරිත්‍යාග කළේ ය.

අදිකාරම්තුමාගේ අහිංසාවාදී ප්‍රතිපත්තිය රට ම දන්නා කරුණකි. පාසල් පරිපාලනයේ දී හා ශිෂ්‍ය විනය සංවර්ධනයේ දී ඔහු අනුගමනය කළ ප්‍රතිපත්ති ශිෂ්‍යයන් තුළ අහිංසාවාදී සිතුවිලි රෝපණය කිරීමට හේතු විය. "ඔවා දෙනු පරහට තමා සම්මතෙහි පිහිටා සිට" යන කියමන අකුරට ම අනුගමනය කළ එතුමා තම අවිහිංසාවාදී පිළිවෙත ක්‍රියාවෙන් ම සනාථ කළේ ය. සොබා දහමට පරිසරයට ඇලුම් කළ එතුමා තමා ද එහි කොටසක් ලෙස සැලකුවේ ය. අදිකාරම්තුමා විසින් ලියන ලද ලේඛනවලින් හා පවත්වන ලද දේශනවලින් ඔහුගේ අහිංසාවාදී, මානවහිතවාදී දැක්ම මනාව ප්‍රකට කෙරිණි.

## අරුත් පැහැදිලි කිරීම

| පාරිභාෂික වචන | එක් එක් විෂයට අදාළ සංකල්ප හඳුන්වන වචන |
|---|---|
| සමාන වයස්ක | සමාන වයසට අයත් |

## අවබෝධය

1. පාඩමේ ඇතුළත් පර්යේෂණ සඳහා යොදා ගෙන ඇත්තේ කවුරු ද?
2. කුඩා කාලයේ යහළුකම සීමා වන්නේ කුමන කාර්යයකට ද?
3. සැබෑ මිත්‍රත්වයේ ස්වභාවය කුමක් ද?
4. මෙහි මල් පොහොට්ටුවකට උපමා කර ඇත්තේ කුමක් ද?
5. පාඩමේ කියැවෙන ඉතා ම උසස් හැසිරීම කුමක් ද?

## ලිඛිත අභ්‍යාස

1. පහත දැක්වෙන වචන සඳහා සමානාර්ථවත් පද පාඩමෙන් තෝරා ලියන්න.

   i. අවාසනාව
   ii. යහපත්
   iii. මිනිසා
   iv. චාරිත්‍ර
   v. පුෂ්ප

2. පහත දැක්වෙන වචනවලට විරුද්ධාර්ථවත් පද පාඩමෙන් තෝරා ලියන්න.

   i. යුදකාමී
   ii. වෛරය
   iii. අසමාන
   iv. භාග්‍යය
   v. ලොකු

## ප්‍රායෝගික අභ්‍යාස

1. "ආචාර්ය ඊ. ඩබ්ලිව්. අදිකාරම්ගේ ජාතික මෙහෙවර" යන මාතෘකාව යටතේ පාසල් බිත්ති පුවත්පතට ලිපියක් ලියන්න.